# සොරගුණේ කුඩා කතරගම දේවාලයේ සාම්ප්‍රදායික දිග්ගේ නර්තනයේ බෞද්ධාගමික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

හේෂාණි පබසරා අලුත්ගේ[1]

## හැඳින්වීම

සොරගුණු ග්‍රාමයේ පිහිටි සොරගුණු කුඩා කතරගම දේවාලයේ පවතින තේවාවන් අතර ඇති සුවිශේෂී කාන්තා නර්තන තේවාවක් ලෙස දිග්ගේ නැටීම හඳුන්වා දිය හැකි ය. දේවාලයේ දිග්ගෙයිහි දී දෙවියන් වැඩ සිටින මාළිගය ඉදිරියේ ශ්වේතවර්ණ රෙද්දකින් හා හැට්ටයකින් සැරසුණු කාන්තාවන් තිදෙනෙකු තනි පෙළට සිට හස්ත චලන පමණක් දක්වමින් දවුල් වාදනයට අනුව මෙම දිග්ගේ නැටීම සිදු කරනු ලබයි. මෙලෙස ඉදිරිපත් වන දිග්ගේ නැටුමේ බෞද්ධාගමික පසුබිම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය ඔස්සේ සිදු කරනු ලබයි.

## පර්යේෂණ අරමුණ

සොරගුණු කුඩා කතරගම දේවාලයේ පවතින දිග්ගෙයි නර්තනයේ බෞද්ධාගමික පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කිරීම

## පර්යේෂණ ක්‍රමවේදය

මෙය අප රටේ පවතින්නා වූ ඓතිහාසික දේවාලයක් පිළිබඳ ව සහ එහි පවතින ඓතිහාසික කාන්තා නර්තන තේවාවක් පිළිබඳ ව සිදු කරනු ලබන පර්යේෂණයකි. මේ සඳහා වඩාත් ම යෝග්‍ය වූ පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ගුණාත්මක ලෙස දත්ත විග්‍රහ කිරීමේ ක්‍රමවේදය යි. රැස් කරගත් දත්ත ඔස්සේ අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම හෙවත් උද්ගාමී තර්කනය මෙහි දී භාවිත කොට තිබේ. දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් පුස්තකාල අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ද්විත්ව ක්‍රමවේද මෙම පර්යේෂණයේ දී යොදා ගනු ලැබිණ. පුස්තකාල අධ්‍යයනය යටතේ ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය යන ද්විත්වය ම උපයෝගී කොට ගෙන ඇත. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ වංශකථා සහ අත් පිටපත් මඟින් තොරතුරු ලබා ගත් අතර, ද්විතීයික මුලාශ්‍රය යටතේ සොරගුණු දේවාලය පිළිබඳවත් දිග්ගේ නර්තනය පිළිබඳවත් ලියවී ඇති පොත්, පුවත්පත් ලිපි, පර්යේෂණ ග්‍රන්ථ සහ පර්යේෂණ පත්‍රිකා යොදාගෙන ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ දත්ත රැස් කිරීමේ මූලික ක්‍රමවේදයන් වශයෙන් නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා යන ද්විත්ව ක්‍රමවේදයන් මෙම පර්යේෂණයේ දී භාවිත කොට ඇත.

## පර්යේෂණ ගැටලුව

සොරගුණු කුඩා කතරගම දේවාලයේ දක්නට ලැබෙන දිග්ගෙයි නර්තනයේ බෞද්ධාගමික පසුබිමක් තිබේ ද? යන්න මෙහි මූලික පර්යේෂණ ගැටලුව වේ.

---

[1]. *heshanialuthge94@gmail.com*

**පර්යේෂණ සාහිත්‍ය සමීක්ෂාව**

මෙම පර්යේෂණය සඳහා විවිධ අංශවලට අයත් මූලාශ්‍රය අධ්‍යයනය කරනු ලැබුව ද එම මූලාශ්‍රය අතරින්

ශ්‍රියානි රාජපක්ෂ විසින් රචිත සමන් දේවාල පුද සිරිත් (2009),

ශ්‍රියානි රාජපක්ෂ විසින් රචිත සබරගමු නර්තන කලාව (2014),

සමන් කුමාරතුංග විසින් රචිත සබරගමු නර්තන ප්‍රවේණි (2018),

සබරගමු වංශකතාව දෙවන වෙළුම (2003) වැනි කෘති ඇසුරු කර ගනු ලැබූ අතර, එම සෑම කෘතියක ම සඳහන් වන්නේ සපරගමු මහ සමන් දේවාලයේ පැවති දිග්ගේ නර්තනය පිළිබඳ ව යි.

මෙම පර්යේෂණය සඳහා යොදා ගත් වැදගත් කෘතියක් ලෙස පුංචිබණ්ඩාර සන්නස්ගල විසින් රචිත සොරගුණු දේවාල පුවත (1973) සඳහන් කළ හැකි ය. එහෙත් එහි ඇතුළත් වන්නේ සොරගුණු දෙවොලේ දිග්ගේ නැටීමේ අතීත ස්වරූපය පමණි. එහි වත්මන් ස්වභාවය හෝ බෞද්ධාගමික පසුබිම පිළිබඳ සඳහනක් එම කෘතියේ ඇතුළත් නො වේ.

**පර්යේෂණ ලිපි ලෙස**

දයානන්ද විසින් රචිත හින්දු ආගමික දේවදාසී සංකල්පය හා බැඳි සබරගමු මහ සමන් දේවාලයේ දිග්ගේ නර්තනය පිළිබඳ අධ්‍යයනයක් (2017), ඉන්දුකා මදුමාලි විසින් රචිත උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ සාම්ප්‍රදායික දිග්ගෙයි නර්තනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (2018) යනාදිය අධ්‍යයනය කරනු ලැබූ අතර, මෙම පර්යේෂණයේ දී සාකච්ඡා කරනු ලබන සොරගුණු දේවාලයේ දිග්ගේ නැටුමේ බෞද්ධාගමික පසුබිම පිළිබඳ සඳහනක් එම පර්යේෂණ තුළ අන්තර්ගත නො වේ.

**පර්යේෂණ සාකච්ඡාව**

සොරගුණු දේවාලයේ පවතින අනෙකුත් නර්තන අඞ්ග හා සැසඳීමේ දී වඩා අලඞ්කාරත්වයක් උසුලන සහ ඓතිහාසිකත්වයක් උසුලන නර්තන අඞ්ගයක් ලෙස දිග්ගෙයි නර්තනය හඳුන්වා දිය හැකි ය. දේවාලයේ "දිග්ගේ" නම් වූ ශාලාවේ සිට ඉදිරිපත් කරනු ලබන හෙයින් මෙම නර්තනය "දිග්ගේ නැටුම" නමින් හඳුන්වනු ලබයි. සොරගුණු දේවාලයේ පවතින දිග්ගෙය දිගින් වැඩි පළලින් අඩු අඞ්ගනයකි. සොරගුණු දේවාලයේ දිග්ගෙය පිළිබඳ ව විස්තර කෙරෙන පැරණි කවක් මෙසේ දැක්විය හැකි ය.

දිග්ගේ දොරකඩ උළුවහු කනුවට ඇද්දත් වලිනුත් වැඩ දා    ලා
ඒත් මැදින් මැද දිලිසෙන්නට පලිඟු මැණික් ගල් ඔබ්බා    ලා
දිග්ගේ දෙපිටම පෑ මැටි ගාලා සියලු සතුන්ගේ රුව ඇඳ    ලා
දිග්ගේ නැටුමට හොඳට ඉනන්ගුය උඩු වියනුත් වටතිර ඇද    ලා (සන්නස්ගල, 1973, පි. 43)

මෙම කවියෙන් පැහැදිලි වන්නේ දේවාලයේ දිග්ගෙයි නර්තනය නැටීමට පෙර දිග්ගෙය ඉතාමත් අලඞ්කාරවත් ලෙස සරසනු ලබන බව යි. දේවාලයට පෙරහැර ගෙවදුනායින් පසුව දේවාලයේ වැඩ සිටින මාළිගයට ඉදිරියේ තිබෙන දිග්ගේ ශාලාවේ දී මෙම නර්තනය ඉදිරිපත් කරනු ලබයි. සොරගුණු දේවාලයේ දිග්ගෙයි නැටීම සඳහා කාන්තාවෝ තිදෙනකු සහභාගී වෙති.

සොරගුණු දේවාලය හා සම්බන්ධ මාණික්ක නිල පඞ්ගු තුනක් පවතී. එම නිල පඞ්ගුවලට අයත් අතීත රාජකාරියේ නියැලුණු පිරිස් වන්නේ යහපත් හාමි, නොන්නොහාමි, රන්මල්හාමි සහ හාමිනෝනා යන අය යි ( වීරසේන, ස.සා. 2018.09.23).

යාපා රජු දේවාලය ඉදිකොට සොරගුණු ග්‍රාමයේ වැසියන් හට දේවාල රාජකාරි බෙදා දී ඇත. මෙහි දී ඇතැම්විට එක ම පවුලේ සාමාජිකයින් හට විවිධ රාජකාරි අවස්ථා හිමි වී ඇත. උදාහරණයක් ලෙස " මලවරගේ" පෙළපත සඳහන් කළ හැකි ය.

දිග්ගෙයි නැටීමත් කවි ගායනා කිරීමත් තාලම්පට ගැසීමත් දවුල් වාදනය කිරීමත් යන සියල්ල මෙම මල්වරගේ පෙළතට හිමි වී තිබේ. එම පෙළපතේ සාමාජිකයින් "මලවරගේ" යන්න මුලට යොදා පුද්ගලික ව ව්‍යවහාර කරනු ලබන බව සොරගුණේ වීදිය වලව්වේ බණ්ඩාර මොහොට්ටාල නිලමේගේ අත්පිටපත්වල සඳහන් කර තිබේ.

දේවාලයේ දිග්ගේ නර්තනය ඉදිරිපත් කරනු ලබන කාන්තාවන් "මානික්ක නිල පඞ්ගුවට" අයත් වන අතර, මෙම ස්ත්‍රීන්ට නිල වශයෙන් ආමන්ත්‍රණය කරනු ලබන්නේ 'මානික්කාධී' නමිනි. මෙම රාජකාරියෙහි නිරත මානික්කාධීන්ට ඉඩම් පඞ්ගු දේවාලයෙන් ප්‍රවේණි කොට දී තිබේ (බණ්ඩාර මොහොට්ටාල නිලමේගේ අත් පිටපත).

සොරගුණු දේවාලයේ දිග්ගෙයි නර්තන දැක්වීම සඳහා උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ මානික්ක නිල පඞ්ගුවට අයත් කාන්තාවන් සහභාගී වී ඇත. සබරගමු මහ සමන් දේවාලයේ පාරම්පරික දිග්ගේ නැටුමට සම්බන්ධ වූ "හුණුවල වස්තුහාමි" නමැති නිළිය විසින් සොරගුණු දේවාලයේ දිග්ගෙයි නැටුම අරඹන ලද බව පැරැන්නන්ගේ විශ්වාසය යි (සෙනෙවිරත්න, ස.සා. 2018.09.24).

දේවාලයේ දිග්ගේ නැටුම ආරම්භ වන්නේ වර්ෂ 1969 දී ය. වර්ෂ 1970 දී එම රාජකාරියෙහි නිරත මානික්ක නිල පඞ්ගුව විසින් එය පැහැර හැර ඇති බව සොරගුණු වීදිය වලව්වේ අබේරත්න මොහොට්ටාල නිලමේගේ අත් පිටපත්වල සඳහන් කර තිබේ. ඔහු තවදුරටත් එහි දක්වා ඇත්තේ දේවාලයේ කයිකාරයෝ නටන ගැහැණු යනුවෙන් මෙම දිග්ගේ නැටුම් ශිල්පිනියන් පහත් කොට සැලකීම හේතු කොට ගනිමින් මෙම රාජකාරිය පැහැර හැරිය බව යි. රාජකාරිය පැහැර හැරිය විට ඔවුන්ට හිමි වූ දඬුවම වුයේ ඒ වෙනුවෙන් දේවාලයට දඩ මුදලක් ගෙවීම පමණි.

දිග්ගේ නැටුමට සම්බන්ධ මානික්ක නිල පඞ්ගුවේ ස්ත්‍රීන් සැබවින් ම පහත් කුලයට අයිති නො වේ. ඔවුන් පැවත එන්නේ ගොවි කුලයෙන් ම හින්න වූ පරපුරක් වශයෙනි ( වීරසිංහ, ස.සා. 2018.09.23). මෙයින් පෙනී යන්නේ දිග්ගේ නැටීම උසස් කුලවත් කාන්තාවන් විසින් දෙවියන් උදෙසා සිදු කළ තේවාවක් වන බව යි.

දිග්ගෙයි නැටුම "තේවා නැටුම" වශයෙන් ද සොරගුණු දේවාල පුවතේ හඳුන්වා තිබේ (1973.23). දෙදහස් දහඅට වසරේ සොරගුණු දේවාලයේ ඇසල පෙරහැර දිනයේ දිග්ගේ නර්තනය ඉදිරිපත් කළ පොඩිනෝනා නම් වූ නැටුම් ශිල්පිනිය පවසන්නේ ද දිග්ගෙයි නැටීම හුදු නර්තනයක් පමණක් නො ව එය දෙවියන් සඳහා සිදු කරනු ලබන තේවාවක් වන බව යි ( පොඩිනෝනා, ස.සා. (2018.09.23).

සොරගුණේ දේවාලයේ දිග්ගෙයි නර්තනය ඉදිරිපත් කරනු ලබන අවස්ථා මෙසේ දැක්විය හැකි ය.

1. උඩ මළුවේ කුඹල් පෙරහැර දින අට
2. පහල මළුවේ දෙව්ලේ පෙරහැර දින දෙක
3. රන්දෝලි පෙරහැර දින පහ
4. ඉල්මහ කාර්තිකේය උත්සවය දින තුන
5. අවුරුදු මඬ්ගල්‍ය දින තුන

මේ අනුව සොරගුණු දේවාලයේ දිග්ගෙයි නැටීම වසරකට දින විසිඑකක් පමණ සිදු කරනු ලබයි. සොරගුණු දේවාලයේ ඇසළ පෙරහැර මඬ්ගල්‍යයේ දී පෙරහැර වීදි සංචාරය කිරීමෙන් පසුව ගෙවදින සෑම අවස්ථාවකදීමත් දිය කැපීමේ මඬ්ගල්‍යයෙන් පසුවත් දිග්ගේ නැටීම සිදු කරනු ලබයි (වීරසිංහ, ස.සා. 2018.09.23).

**5.2 සොරගුණු දේවාලයේ දිග්ගෙයි නර්තනයේ ස්වභාවය**

සොරගුණු දේවාලයේ පවතින දිග්ගේ නර්තනය පිළිබඳ ව සඳහන් කිරීමේ දී එය ප්‍රධාන වශයෙන් අංශ ද්විත්වයක් යටතේ මෙහි දී දක්වා තිබේ. එනම් සොරගුණු දේවාලයේ දිග්ගේ නර්තනයේ අතීත ස්වරූපය සහ වර්තමාන ස්වරූපය යනාදී වශයෙනි.

දිග්ගේ නැටුම සම්බන්ධයෙන් සොරගුණු වීදිය වලව්වේ අබේරත්න මොහොට්ටාල නිලමේගේ අත් පිටපත්වල සඳහන් කර ඇති කරුණු දෙස බැලීමේ දී මෙලෙස වර්ගීකරණයක් කිරීමට සිදු විය. එයින් වඩාත් පැහැදිලි ව සොරගුණු දේවාලයේ පවතින දිග්ගේ නර්තනයේ අතීත ස්වරූපය සහ අද්‍යතන ස්වරූපය මැනවින් වටහා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

**5.2.1 සොරගුණු දේවාලයේ දිග්ගෙයි නර්තනයේ අතීත ස්වරූපය**

දිග්ගෙයි නර්තනය අඩව්වලින් තොර වූ ලාස්‍ය ගණයේ නර්තනයකි. මෙම නර්තනය අවස්ථා තුනකින් සමන්විතව ඉදිරිපත් කළ බවට තොරතුරු බණ්ඩාර මොහාට්ටාල නිලමේගේ අත් පිටපත්වල සඳහන් කර තිබේ.

මෙහි දී ගැයෙන සුමන දෙවි අනුස්මරණ ශ්ලෝකයක් ද එම අත් පිටපත් වල සඳහන් කර ඇත.

"පෙර ලෝක උප්පද කළ වාසු දේවං

නර ලෝක විධි ශාසනේ රක්ඛ තේජං

සුර ආසනේ ශක්‍ර දෙව්රාජ කරණං

මිනි පබ්බතේ සුමන දෙව් රාජ වන්දිතං"

දෙවැනි අවස්ථාවේ දී සිදු වන්නේ වාදනයකට අනුව නැටුම් කොටසක් ඉදිරිපත් කිරීම යි. නමුත් එම වාදන කොටසේ පද හෝ එහි නර්තන විලාශය පිළිබඳ ව කිසිඳු තොරතුරක් බණ්ඩාර මොහොට්ටාල නිලමේ තම අත් පිටපත් තුළ අන්තර්ගත කොට නොමැත.

දිග්ගෙයි නැටීමේ අවසන් අවස්ථාවේ දී "**තරිකිට දොං තා**" යන පදයට වම් ඇලයට නටාගෙන ගොස් නැවත දකුණු ඇලයට හැරී එම පදයට ම නටාගෙන චිත් යළිත් "**තරිකිට දොං - තරිකිට දොං - තරිකිට දොං - තත්තා**" යන පදයට නටමින් දෙවියන්ට නමස්කාර කරනු ලබන බව බණ්ඩාර මොහොට්ටාල නිලමේගේ අත් පිටපතෙහි සඳහන් කොට තිබේ.

සින්දු අඩියක් රඟ දක්වන්නට කියා දේවාල ප්‍රධාන නිලධාරීන් ඉල්ලා සිටියහොත් පමණක් වෙනස් ම වූ තාලයකට සිත්කලු නැටුමක් ඉදිරිපත් කරනු ලබයි. "සින්දු" යන්නෙන් අදහස් කරනුයේ තාලයකට අනුව කියනු ලබන ගීත වශයෙන් ගැමි නාටකයේ දක්වා තිබේ (සරත්චන්ද්‍ර, 1968. 160).

එයට කවි නිල පඬිගුවේ දෙදෙනා තාලම්පට වයමින් මුද්‍රපද සින්දුවක් ගායනා කරන අතර, දවුල් වාදකයා විසින් මාත්‍රයට අනුව දවුල වාදනය කිරීමත් සිදු කරනු ලබයි. මුද්‍රප්පදයක් යනුවෙන් දක්වා ඇත්තේ සමූහ ගායනය සඳහා සැපයුණු තාල පදය යි. මෙය බටහිර සඞ්ගීතයේ කෝරස් වැනි ය (සේදරමන්, 1997. 25)

දිග්ගෙයි නර්තන අවස්ථාවන්හී දී ගායනා කරනු ලැබූ මුද්‍රපද සින්දුවක් සොරගුණු වීදිය වලව්වේ බණ්ඩාර මොහොට්ටාල නිලමේගේ අත් පිටපත් තුළ මෙසේ සඳහන් වී ඇත.

"**මයුර වාහන පප්‍ර තාපනේ - වේලව් දැරු වේලව් දැරු මයුර වාහන පප්‍ර තාපනේ - මයුර වාහන පප්‍ර තාපනේ මහාසේන දීපප්‍ර රූප සයුර වටෙහි නිතර ම වැඩි කුමර වේල මුත්ති ධීරනේ - දිරිතර කර සිඳු රතමුන බැරි යදිමින් පත්මාපුර ගිරි නිඳුවම ගොස් වඩිනට හැරි වේලා යුද උතුම් - පෙර කර සිටි ආමර සිංහරා පුරදරා පුරදරා නිරකර රැකදෙන්ට වැඩිය මෙ කුමර සේනා දීප වල්ලි මාල එබිසෝ වෙත, ලොල්ල වඩන පෙර හිමවත ඇල්කෙත සිටි වැදී දෙව් මඞ්ගලා සැදූ පූජිතා - සුන්දර තුනු රූප සෝබිනා - බර නෙතා බර නෙතා, සුන්දර ජිත ශ්‍රී වංක්‍රසසංක සංක්‍ර භාසුරා - පතර එකවි ලාසන සිට අතර සිතම් බරමට වැඩ ලකර තිරික් කෝවිල් කර කතර පුරෙහි වාස ඌ අතර බඳුළු පුර ද සොරගුණේ සැම තැනේ සැම තැනේ මෙතිර එසෙන්කඩගල සහ ඇවැති පුරෙහි වාස වූ මයුර වාහන -**"

මෙකී මුද්‍රපදයෙන් අර්ථ දැක්වෙන්නේ කතරගම දෙවියන් පිළිබඳ ව කෙරෙන වර්ණනාවක් වශයෙන් පෙන්වා දිය හැකි ය. සින්දු හා සමානවන මුද්‍රපද හින්දු කෝවිල්වල නළඟනන්ගේ නැටුමට ඉතාමත් ප්‍රණීත වූ බව උඩරට නර්තන කලාවේ සඳහන් කර තිබේ (සේදරමන්, 1997. 25).

අත් පිටපත්වල සඳහන් මෙම මුද්‍රපද සින්දුවේ මුද්‍රපද කොටස වන්නේ "**මයුර වාහන පප්‍ර තාපනේ**" යන්න යි.

### 5.1.2 සොරගුණු දේවාලයේ දිග්ගෙයි නර්තනයේ වත්මන් ස්වරූපය

පෙරහැර ගෙවදීමෙන් පසුව කවි නිල පඬ්ගුවේ සාමාජිකයින් විසින් කවි ගායනා කරනු ලබයි. මෙහි දී ගැයෙන කවියක් පහත පරිදි සඳහන් කළ හැකි ය.

"එකල් යාපා නිරිඳු යුදයට ගොසින් දෙවරක් පැරදුනේ
සියල් සිවුරඟසෙනඟ සැදෙමින් තුන් වෙනුව වඩිනා දිනේ
එකල් මැදගම යන මෙගම දී සක් නඳක් ඇසුණයි මනේ
විපුල් රිවිකුල ප්‍රභුපති මේ කිමෙක් දැයි වදහල තැනේ"

(පියසේන, සා.සි., 2018.08.02)

මෙම ගායනාවන් අවසන් වූ පසුව විනාඩි දෙකක් පමණ කෙටි කාලයක දී කාන්තාවන් තිදෙනෙකු දේවාලයේ දෙවියන් වැඩ සිටින මාළිගයේ ඉදිරිපිට ඇති දිග්ගෙයි දී තිරස් අතට තනි පෙළක් වශයෙන් සැදී දිග්ගෙයි නැටීම ආරම්භ කරයි.

අතීතයේ දී දීර්ඝ වේලාවක් මෙම නර්තනය සිදු කළ බව සිව්වන පරිච්ඡේදයේ දැක් වූ තොරතුරු මගින් ගම්‍ය වේ. නමුදු වර්තමානයේ දී දක්නට ලැබෙන්නේ දිග්ගේ නර්තනයේ ඉතාමත් සඞ්ක්ෂිප්ත කොටසක් පමණක් වන බව නිරීක්ෂණයන්හි දී අනාවරණය කරගත හැකි විය.

වර්තමානයේ දී දිග්ගේ නැටීම ලෙස ඉදිරිපත් වන්නේ හස්ත චලන දැක්වීමක් පමණි. වම් අත වැලම්ටෙන් නමා වම් ඇලයට තෙවරක් ද දකුණු අත වැලම්ටෙන් නමා දකුණු ඇලයට තෙවරක් ද ඔසවනු ලබයි. නැවතත් අතේ මහපට ඇඟිල්ල හා දබර ඇඟිල්ල එකට අල්ලා (පහතරට නැටුම් මූලික හස්ත තබා ගන්නා ආකාරයට සමාන ව) වම් අත තෙවරක් ද දකුණු අත තෙවරක් ද වැලම්ටෙන් නමා ඔසවයි. අවසානයේ දී වම් අත්ලට මඳක් ඉහළින් දකුණු අත්ල සිටින සේත් නැවතත් දකුණු අත්ලට මඳක් ඉහළින් වම් අත්ල සිටින සේත් සිව් වතාවක් තබා දෙවියන්ට නමස්කාර කිරීමෙන් දිග්ගෙයි නැටීම අවසාන කරනු ලබයි.

මෙහි දී පාද ඉහලට එසවීමක් කිසිසේත් ම දක්නට නො ලැබෙන අතර, **"ජිං දං දං දං දං - ජිං දං දං"** යන දවුල් පදයට අනුව හස්ත චලනය කිරීම පමණක් සිදු කරනු ලබයි.

උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ ද පවතින්නේ මෙම සොරගුණු දේවාලයේ මෙන් හස්ත චලන දැක්වීමෙන් පමණක් සිදු කරනු ලබන දිග්ගේ නැටීමකි. නමුත් සොරගුණු දේවාලයේ මෙන් නො ව මෙහි දී හස්ත එසවීමේ වෙනස්කම් දක්නට ඇත. වර්තමානයේ දී උග්ගල් අලුත් නුවර දේවාලයේ දිග්ගේ නැටුමේ රඞ්ගන විලාශය ලෙස හස්ත නැටුමේ මනරබා සම්ප්‍රදායට අයත් දිග්ගෙයි නැටීම පෙන්වා දිය හැකි ය (වීරසේකර, 2003. 557).

වර්තමානයේ දී සොරගුණු දේවාලයේ දිග්ගෙයි නැටීම සඳහා සහභාගී වන කාන්තාවන් සිදු කරනු ලබන හස්ත චලන දැක්වීම තුළින් ප්‍රකාශ වන්නේ කුමක් ද යන්න පිළිබඳ ව වර්තමානයේ එම රාජකාරියේ නියුතු පිරිස පවා හරිහැටි නො දනිති. ඔවුන් එම කාර්යය කරනුයේ හුදු ඉඩම් භුක්තිය සඳහා ම පමණි.

දිග්ගෙයි නැටීම අවසන් වූ විට නැවතත් කවි නිල පඬුවේ සාමාජිකයින් විසින් 'මඞ්ගලම් කවි' ගායනය කිරීම ආරම්භ කරයි. මෙහි දී ගැයෙන මඞ්ගලම් කවියක් පහත පරිදි උපුටා දැක්විය හැකි ය (සන්නස්ගල, 1973. 42).

"තුන් ලොවේ සිරි සැපත දිවැසින් ලබා වැඩි ජය මඞ්ගලම්
පිං බලේ පෑ රාම යුද කර යුදෙන් දිනු ජය මඞ්ගලම්
සං සලේ පා ලෝ සතුන් හට රැක්ක වූ ජය මඞ්ගලම්
සිංහලේ මහ රජුට ජය කර මෙ දෙවි රැකි සුබ මඞ්ගලම්"

අතීතයේ දී දිග්ගෙයි නැටීමේ දී කවි ගායනා ඉදිරිපත් කළ ද වර්තමානයේ දී පවතින්නේ ගායනාවන්ගෙන් තොර වූ නැටුම් කොටසකි. මෙහි දී මොට්ටුනිලමක්කාරයා විසින් දවුල වාදනය කරනු ලබන අතර, කවි නිල පඬුවේ සාමාජිකයින් සිව්දෙනා තාලම්පට වාදනය කරනු ලබයි. මෙහි දී වාදනය කරනු ලබන දවුල ප්‍රමාණයෙන් තරමක් විශාල වේ.

**5.2 දිග්ගෙයි නැටීම සඳහා භාවිත කරනු ලබන රඞ්ගන වස්ත්‍රාභරණ**

පුරාණයේ දිග්ගේ නර්තනය ඉදිරිපත් කළා සේ සැලකෙන්නේ ඔසරිය මත්ත, හැට්ටය සහ රං මාල රඞ්ගන වස්ත්‍රාභරණයන් ලෙස යොදා ගනිමිනි. ඒ බව පහත සඳහන් කවිපාදයෙන් ගම්‍යමාන වේ (රාජපක්ෂ, 2009. 266).

**"ඇඳල ඔසරිය මත්ත හැට්ටය රං මාල බැඳ සුරඟනන් මෙන්"**

නමුත් වර්තමානයේ දී දිග්ගේ තේවාව සඳහා සම්බන්ධ කාන්තාවන් සුදු අත් කොට හැට්ටයකින් හා සුදු රෙද්දකින් සැරසෙන අතර, තවත් අයෙක් සුදු ඔසරිය රඞ්ග වස්ත්‍ර ලෙස භාවිත කරයි. ආභරණ පැළඳීමක් දක්නට නොමැති අතර කොණ්ඩය බෙල්ලට බැඳ තිබේ.

**පර්යේෂණ සමාලෝචනය**

අතීතයේ දී සොරගුණු දේවාලයේ දිග්ගේ නැටීමේ තේවාව ඉතා ඉහළ අඳැමින් සිදු වූ බවට තොරතුරු වාර්තා වුව ද වර්තමානයෙහි මෙම දිග්ගේ රාජකාරිය කෙරෙහි දේවාලයේ ඉහළ නිලධාරීන්ගේ අනුග්‍රහය යොමු නො වීමත් දිග්ගේ රාජකාරිය පිළිබඳ ව නිසි ලෙස දන්නා පැරණි ශිල්පිනියන්ගේ අභාවයත් සහ වර්තමානයේ දිග්ගේ තේවාවේ නිරත පිරිසගේ නො දැනුවත්කමත් හේතුකොට ගනිමින් මෙම රමණීය කාන්තා නර්තන විලාසය සොරගුණු දේවාලයෙන් අභාවයට යන තත්ත්වයකට පත්ව ඇත. එපමණක් නො ව දේවාලය සම්බන්ධ සියලු චත්පිළිවෙත් මුදලට යටවීමත් සහ එක ම පවුලේ සහෝදර

සහෝදරියන් අතර මෙම නිල රාජකාරි බෙදී යාමත් හේතුවෙන් මෙම වටිනා සංස්කෘතික උරුමයන් මඟහැරී ගොස් ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් ම හේතුසාධක වී ඇත්තේ පරිපාලනයේ පවතින දුර්වලතාව යි.

එමෙන් ම සොරගුණු දේවාලයේ දිග්ගේ නැටීමේ තේවාව තුළ බෞද්ධාගමික පසුබිමක් දක්නට නොමැති බවත් එය ඉන්දියානු දේවදාසී ආභාසය ඇති ව මෙරට ව්‍යාප්ත වී ඇති බවත් මෙය හුදෙක් දෙවියන් උදෙසා කරනු ලබන දේවපූජාත්මක නර්තනයක් වන බවත් මෙහි දී පෙන්වා දිය හැකි ය.

**ප්‍රමුඛ පද:** සොරගුණේ, කතරගම, සාම්ප්‍රදායික, දිග්ගේ, බෞද්ධාගමික, නර්තනය

මූලාශ්‍රය


- අත්තනායක, ඒ.ඇල්.ඒ.පී.කේ. (2017). **සොරගුණේ කුඩා කතරගම දේවාලයේ චත්පිළිවෙත් හා බැඳි කලා අංගයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්** (ප්‍රසාංගික කලාවේදී විශේෂ උපාධි 2011-2012 ස්වාධීන අධ්‍යයන නිබන්ධය). සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.
- ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ (1997). **දඹදෙණිඅස්න සහ කඳවුරුසිරිත.** කර්තෘ ප්‍රකාශන.
- කුමාරතුංග, සමන් කේ.ඇම්. (2018). **සබරගමු නර්තන ප්‍රවේණිය.** කොළඹ 10: සූරිය ප්‍රකාශකයෝ.
- කුලතිලක, සී.ද.ඇස්. (2007). **ලංකාවේ සංගීත සම්භවය.** කොළඹ10: ඇස් ගොඩගේ සහෝදරයෝ.
- කුලසිංහ, ඒ.ඇම්. (2006). **හල්දුම්මුල්ල විත්ති.** මහරගම: කර්තෘ ප්‍රකාශන.
- කෝට්ටේගොඩ, ජයසේන (1995). **සබරගමු කිරිමඩු ශාන්තිකර්මය.** කොළඹ 11.
- දයානන්ද, එච්.පී.ටී.ඩී. (2017). **හින්දු ආගමික දේවදාසී සංකල්පය හා බැඳි සපරගමු මහ සමන් දේවාලයේ දිග්ගේ නර්තනය පිළිබඳ අධ්‍යයනය.** ජනශ්‍රැති පිළිබඳ පර්යේෂණ සමුළුව-සාර සංක්ෂේපය, කලා පර්ෂදය හා සංස්කෘතික මධ්‍යස්ථානය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
- දිසානායක, මුදියන්සේ (2002). **ලලිත කලා සාරසංග්‍රහය** ජූලි දෙසැම්බර් කලාපය. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.
- පොන්නම්පෙරුම, ඩී.පී. (1961). **විදේශීන් දුටු පුරාණ ලංකාව.** මහනුවර: ආර්ය මුද්‍රණාලය.
- මදුමාලි, ඉන්දුකා ජී.ඩී. (2018). **උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ සාම්ප්‍රදායික දිග්ගේ නැටුම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්.** වාර්ෂික පර්යේෂණ සමුළුව-සාර සංක්ෂේපය, රාජකීය ආසියාතික සංගමය. ශ්‍රී ලංකාව.
- ශ්‍රී සුමංගල, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාව (සංස්.). (2003). **මහාවංශය** (ප්‍රථම භාගය). කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
- දීපිකා, මානෙල් ඇස්.ඩී. (1995). **ශ්‍රී ලංකාවේ දේශීය සතරවරම් දෙවිවරු.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- රාජපක්ෂ, ආර්.ඇස්.ඒ.අයි. (2009). **දිග්ගේ නර්තනයේ මනෝවිද්‍යාත්මක පසුබිම** (ප්‍රාසාංගික කලා විශේෂ උපාධි 2004-2005 ස්වාධීන අධ්‍යයන නිබන්ධය). කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය.
- රාජපක්ෂ, ශ්‍රියානි (2009). **සමන් දේවාල පුදසිරිත්.** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ
- රාජපක්ෂ, ශ්‍රියානි (2014). **සබරගමු නර්තන කලාව.** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම.
- රණතුංග, ප්‍රේමකීර්ති. **සබරගමුවේ පුරාණ නින්දගම්.** ඉරිදා ලංකාදීප, (2017), නොවැම්බර් 12.
- රණතුංග, ප්‍රේමකීර්ති (2018). **අවසාන නින්දගම.** කොළඹ10: දයාවංශ ජයකොඩි සහ සමාගම.
- රත්නපාල, ඊ.ඇම්. (1992). **සමන් දෙවියෝ,** කොළඹ 10: එස් ගොඩගේ සහ සහෝදරයෝ.
- ආටිගල, සර් නිකලස්., ලබ්රෝයි, ඩබ්ලිව්. ජේ. එෆ්., නටේසන්, එස්., නිකලස්, සී. ඩබ්ලිව්. සහ පරණවිතාන, සෙනරත් (සංස්.). (1972). **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය** සවන කාණ්ඩය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

- අමරවංස නාහිමි, අකුරටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර (සංස්.). (1994). **වංසත්ථප්පකාසිනී** (මහාවංශ ටීකාව). පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය. කැලණිය විශ්වවිද්‍යාලය.
- වජිර බුද්ධි හිමි, මඩලගම. **ඉතිහාසයේ සඳහන් සපරගමු වෙහෙර.** සිකුරාදා දිනමිණ. (2011). සැප්තැම්බර් 9.
- සන්නස්ගල, පුංචිබණ්ඩාර (1973). **සොරගුණු දේවාල පුවත.** කර්තෘ ප්‍රකාශන.
- සරත්චන්ද්‍ර, එදිරිවීර (1999). **සිංහල ගැමි නාටකය.** කොළඹ 10: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
- රත්නපාල, නන්දසේන (සංස්.). (1969). **සැවුල් සන්දේශය.** කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.
- සුභසිංහ, ඇස්.ඇම්,ආර්,ජේ. (2014). **ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම්.** ජාතික මධ්‍ය රූප අධ්‍යයන හා සංස්කෘතික කේන්ද්‍රය.
- සේදරමන්, ජේ.ඊ. (1997). **උඩරට නැටුම් කලාව.** කොළඹ 11: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම
- සේනානායක, මහේන්ද්‍ර (2003). **සබරගමු වංශකතාව** (දෙවන වෙළුම).
- සෝරත හිමි, අලුත්වැව (1993). **කතරගම පුදසිරිත්.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

**අත් පිටපත්**

- **බණ්ඩාර මොහොට්ටාල නිළමේගේ අත්පිටපත්,** සොරගුණු වීදිය වලව්ව, 2018/09/24.

**සම්මුඛ සාකච්ඡා**

- පියසේන, මලවරගේ. **කවිනිලය සොරගුණ දේවාලය,** 2018.08.02, නිවසේ දී
- පොඩිනෝනා, කේ. ඇම්. **මාණික්කනිලය,** 2018.09.23, සොරගුණු දේවාලයේ දී
- ලීලාරත්න, ටී. **තණ්ඩල්රාල සබරගමු මහා සමන් දේවාලය,** 2018.06.12, නිවසේ දී
- වීරසිංහ, ඩබ්. ඇම්. **කපු නිලය සොරගුණු දේවාලය,** 2018.09.23, සොරගුණ දේවාලයේ දී
- සෙනවිරත්න, ජේ. ඇම්. **අත්නායක නිලය සොරගුණු දේවාලය,** 2018.08.02, නිවසේ දී
- **අත්නායක නිලය සොරගුණු දේවාලය,** 2018.08.02, නිවසේ දී
- සෙනවිරත්න, ජේ. ඇම්. **අත්නායක නිලය සොරගුණු දේවාලය,** 2018.09.24, නිවසේ දී
- සෙනවිරත්න, ජේ. ඇම්. **අත්නායක නිලය සොරගුණු දේවාලය,** 2018.02.13, නිවසේ දී